# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/9 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2018.09.25 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 04-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
ප්‍රධාන ගණකාධිකාරී වරුන්
හා ගණකාධිකාරීවරුන් වෙත.

## ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය සංශෝධනය කිරීම සංයුක්ත දීමනාව

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2018 හා 2018.08.21 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02.එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/3/1 හා 2018.09.13 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.එමගින් ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4:4:3 හා 4:5 උප වගන්ති කෙරෙහි අවධානය යොමුකර ඇත.

04.එම උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට 2018.07.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බව සඳහන් කර ඇත.

4:4:3 නිලධරයකු පැය 24ට වඩා අධික කාලයක් කාර්ය ස්ථානයෙන් පිටත ගතකරන විට සති තුනක උපරිම කාල සීමාවක් දක්වා , ඒ එකිනෙක පැය 24ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාවෙන් 50% ක අමතර දීමනාවක් ඔහුට ගෙවිය හැකිය. සංයුක්ත දීමනාවෙන් 50% ක අමතර දීමනාව පැය 24ට අඩු කුමන කාල පරිච්ඡේදයක් සඳහා වුවද ගෙවිය නොහැකිය.

4:5 ගාස්තු ප්‍රමාණය - ගෙවිය යුතු සංයුක්ත දීමනාවේ ප්‍රමාණය නිගමනය කළ යුත්තේ පහත දැක්වෙන පරිදි නිලධරයාගේ මාසික වැටුප පදනම් කරගෙනය.(1:3 උප වගන්තිය බලන්න.)

| මාසික මූලික වැටුප | පැය 24ක එක් එක් සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාව |
|---|---|
| රු.32,779.00 දක්වා | රු. 700.00 |
| රු.32,780.00 සිට රු.43,479.00 දක්වා | රු. 800.00 |
| රු.43,480.00 සිට ඉහළට | රු.1,000.00 |


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle

**05.** ඉහත විධිවිධාන 2018.08.23 දින හෝ එදිනෙන් පසු යෙදෙන රාජකාරී ගමන් සඳහා අදාළ වේ.

**06.** මෙම සංයුක්ත දීමනාව ගෙවීමේදී ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් අනුමත කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ කළමනාකරණය කර ගැනීමට (මුදල් රීති 30 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම මගින්) කටයුතු කළ යුතු අතර, එසේ කළ නොහැකි අවස්ථාවකදී පමණක් කල්වේලා ඇතිව පරිපූරක ඇස්තමේන්තුවක් මගින් අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගත යුතුය.

**07.** මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ගෙවීම් කටයුතු කරන ලෙස දැනුම් දෙන අතර, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:-

1. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ( අයවැය / ගිණුම් හා ගෙවීම් ) : අ.ක.ස.
3. අධ්‍යක්ෂ, දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව : දැ.ගැ.ස

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2018

මගේ අංකය : EST-6/06/TVL/3030
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.08.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය සංශෝධනය කිරීම සංයුක්ත දීමනාව

ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 4:4:3 හා 4:5 උප වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට 2018.07.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

4:4:3 නිලධරයෙකු පැය 24ට වඩා අධික කාලයක් කාර්ය ස්ථානයෙන් පිටත ගතකරන විට සති තුනක උපරිම කාල සීමාවක් දක්වා, ඒ එකිනෙක පැය 24ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාවෙන් 50%ක අමතර දීමනාවක් ඔහුට ගෙවිය හැකි ය. සංයුක්ත දීමනාවෙන් 50%ක අමතර දීමනාව පැය 24ට අඩු කුමන කාල පරිච්ඡේදයක් සඳහා වුවද ගෙවිය නොහැකිය.

4:5 ගාස්තු ප්‍රමාණය - ගෙවිය යුතු සංයුක්ත දීමනාවේ ප්‍රමාණය නිගමනය කළ යුත්තේ පහත දැක්වෙන පරිදි නිලධරයාගේ මාසික වැටුප පදනම් කරගෙනය. (1:3 උප වගන්තිය බලන්න)

| **මාසික මූලික වැටුප** | **පැය 24ක එක් එක් සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත දීමනාව** |
|---|---|
| රු.32,779.00 දක්වා | රු.700.00 |
| රු.32,780.00 සිට රු.43,479.00 දක්වා | රු.800.00 |
| රු.43,480.00 සිට ඉහළට | රු.1,000.00 |

03. ඉහත විධිවිධාන 2018.08.23 දින හෝ එදිනෙන් පසු යෙදෙන රාජකාරී ගමන් සඳහා අදාළ වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

P.J.
පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ